# 14

# ක්‍රිස්තුස් වහන්සේ තුළ සමාජය

" පාසල ඇරී ගෙදර යමින් සිටි සොයුරන් දෙදෙනෙක් මහ මඟ අනතුරට ලක් වූ පුද්ගලයකුගේ දිවි බේරාගෙන පලා යමින් සිටි රථය ද අඳුනා ගනිති. මොවුන්ගේ ක්‍රියාව මුළු සමාජයට ම ආදර්ශයකි."

" උදේ පාන්දරින් අපට කෑම උයන්න නැගිටි අම්මා වතුර ගේන්නට ළිඳ ලඟට ගොස් ළිඳේ වැටී සිටියා. මම කඹයක් අල්ලාගෙන අම්මා බේරාගන්නට උත්සාහ කළා. අම්මාගේ කොණ්ඩයෙන් ඇදලා ගන්න හොඳ නැති නිසා මම නැමිලා ඇගේ අත් යටට අත දමා ගිලෙන්නට නොදෙමින් නැමීගෙන දිගින් දිගට ම සිටිමින් මාමලා එනතෙක් කෑ ගසමින් ඇය ව උස්සාගෙන සිටියා මාගේ වයස අවුරුදු 11 යි.

ඉහත සඳහන් පුවත්පත් ප්‍රකාශ දෙක පවුලක් ගැන පවුලක දරුවන් ගැන ඔවුන්ගේ සමාජ මෙහෙවර ගැන ජීවිත ආකල්ප ගැන කුමක් පවසයි ද? අද සමාජය තුළ යහපත් සමාජයීය ආකල්ප හා ක්‍රියාදාමයන් සම්පූර්ණයෙන් ම අහෝසි වී ගොස් නැති බවත් නමුත් පසුබෑමකට ලක් වී ඇති  බවත් අපි දකිමු. සමාජ සබඳතා සමඟ ජීවත් වන කිතුනුවෙකු තුළ ක්‍රිස්තුස් වහන්සේ සමඟ ඇති වන පෞද්ගලික සබඳතාවය, පවුල් කරා විහිදී ගොස් ලෝකය තුළ යුක්ති ගරුක ව ජීවත්වීමට අවශ්‍ය පදනම දමමින් සමාජ පරිවර්තනයක් කරා ද ගෙන යයි.

සමාජය තුළ විවිධ ආකල්ප හා හැසිරීම් රටා පවතින නමුත්, කිතුනු පවුල තුළින් පුද්ගලයා ලබන යහපත් පන්නරයෙන්, මුළු පවුලේ ම යහපත සඳහා ගුණගරුක දායකත්වයෙන් මහත් මෙහෙවරක් ඉටු වේ.

## මුල් කිතුනු සභාව

එසේ ම අප මුල් කිතුනු සභාව දෙස බලන කල, එහි දී සෑම කෙනෙකු ම එක විශාල පවුලක් සේ ජීවත් වූ බව මනාව පැහැදිලි වේ.

එදා පැවති සමාජ පරිසරය තුළ සමාජ අගයයන් උදාරතර ලෙසට ඔප් නංවමින් නව සමාජ සංස්කෘතියක් සඳහා මුල් සභාවේ විශාල කිතුනු පවුල ක්‍රියාත්මක විය.

සාධාරණත්වය යුක්තිගරුකත්වය හා එකිනෙකා පෝෂණය කිරීම පිළිබඳ ව මුල් සභාව කැඩපතකි. අද සමාජයේ අපවිත්‍ර ව පවතින ඊර්ෂ්‍යාව, අල්ලස, ආත්මාර්ථකාමීත්වයට මුල් කිතුනු සභාව අභියෝගයක් සහ ආදර්ශයකි. මුල් සභාව ක්‍රියාත්මක වීමේ දී බාධක හා අර්බුද පැවති බව ද පෙනේ.

ක්‍රිස්තුස් වහන්සේ වෙනුවෙන් සමාජ මෙහෙවරහි යෙදීමට කිතුනුවාට අභියෝගයක් ඇත. " ඒ බව මතෙව් 25 පරිච්ඡේදයේ යුගාන්තය හා ජාතීන්ගේ විනිශ්චය දිනය පිළිබඳ ව ජේසුස් වහන්සේගේ ඉගැන්වීම පෙන්වා දෙයි. " එදින කිතුනු  පැවැත්ම ප්‍රශ්න කෙරේ.





මතෙව් 25 : 31   46

සාගිනි ව සිටියෙමි	කන්නට දුන්නහු ද?
පිපාස ව සිටියෙමි	බොන්නට දුන්නහු ද?
ආගන්තුක ව සිටියෙමි	ගෙදරට පිළිගත්තාහු ද?
වස්ත්‍ර නැති ව සිටියෙමි	වස්ත්‍ර දුන්නහු ද?
රෝගාතුර ව සිටියෙමි	මා බලාගත්තහු ද?
හිරගෙදර සිටියෙමි	මා බලන්නට ආවහු ද?

මෙහිදී ජේසුස් වහන්සේ පීඩිත ජනතාව තුළ මාංශවත් ව සිටින බව හැඟේ. ලෝකය පෝෂණය කිරීම හා රැකබලා ගැනීම කිතුනුවා, කිතුනු පවුල, කිතුනු සමාජය, ජේසුස් වහන්සේට ම කරන සේවයක් සේ සැලකේ. දිනපතා ලැබෙන සියළු අවස්ථාවන්හි මෙවන් සේවයේ යෙදීම කිතුනුවකුගේ වගකීම යි.

එහිදී ජාති, කුල, ආගම්, වර්ණ, භාෂා කිසිම භේදයක් නැතිව ඒ මෙහෙවරෙහි යෙදිය යුතු ය. ස්වාමීන් වහන්සේ සමඟ තබන සම්බන්ධතාවය ඒ සඳහා බලය උත්පාදනය කරයි.

ඒසේ ම අද සමාජය තුළ ගැටළු හා අර්බුදවලට මුහුණ දී සිටින පීඩිත දරුවන් ගණන දිනෙන් දින ඉහළ යමින් තිබේ ඔවුන්ට උරුම පරිසරය, ලෝකය ගොඩනැංවීම කළ යුත්තකි.







## විවිධ ගැටළුවලට පත් ව සිටින දරුවන්



අද ශ්‍රී ලාංකික සංදර්භය තුළ ළමුන් මුහුණ දෙන විවිධ අවස්ථා

- සුනාමි ව්‍යසනය නිසා අනාථ ව සිටින දරුවන්
- වීථි දරුවන්
- අතවරවලට ලක් වූ දරුවන්
- මව/පියා විදේශගත වීමෙන් තනි වූ දරුවන්
- ළමා මෙහෙකාරකමෙහි යොදවන දරුවන්
- යුද්ධය නිසා අසරණ වූ තනි වූ දරුවන්
- කැඩුණු දෙමාපිය සබඳතාව නිසා පීඩාවට පත් දරුවන්
- මත්ද්‍රව්‍යවලට ඇබ්බැහි වූ දරුවන්

පටු ලාභ නොතකා, දේව ප්‍රේමයට ප්‍රතිචාර දැක්විය යුතු ය. ප්‍රතිපත්තිගරුක ලෙසට කැප වී සමාජ මෙහෙවර කුමන බාධක මැද දී වුව ද කිරීම ක්‍රිස්තුස් වහන්සේ අපේක්ෂා කරන සේක. වැඩිහිටියන්සේ ම ළමුන් ද මේ තත්ත්වවලට මුහුණ දී සිටින දරුවන් වෙනුවෙන් තමාට ලැබෙන ඕනෑම අවස්ථාවක දී ප්‍රේමයෙන් හා වගකීමෙන් කටයුතු කළ යුතු ය.  ළමා ලෝකය තුළ තම සහෝදර සහෝදරියන් ගැන වගකීමක් තමන්ට ද ඇති බව ඒත්තු ගත යුතු යි.

අප රටේ මෑත කාලයේ දී පවුලේ උණුසුම අහිමි වූ එය පතන දරුවන් කිහිප දෙනකු බැගින් එක්කොට සේවයට කැපවුණු කාන්තාවක් මඟින් ඇය මවක ලෙස හඳුනාගෙන ගෙදරක් නිර්මාණය කොට සංවිධානාත්මක ව ඔවුන් රැකබලා ගැනීම සිදු වී තිබේ.

## කිතුනු පවුල සමාජ මෙහෙවරෙහි යෙදීම හීන කරන කරුණු

1. කිතුනු අනන්‍යතාවය දුර්වල වීම / භේද භින්නතා / දේව රාජ්‍යයේ ප්‍රතිපත්ති පිළිබඳ ව තේරුම් ගැනීම මද වීම.
2. ආත්මික ශක්තිය හීන වීම.
3. ආත්මාර්ථය කරා පෙළඹීම.
4. ක්‍රිස්තුස් වහන්සේගේ සේවක කාර්යභාරයේ නොයෙදීම.

(ජොහාන් 13 :13 15 )

මෙසේ යුක්තිගරුක සමාජයක් ගොඩනැංවීම ද ක්‍රිස්තු වහන්සේ තුළ තබන සම්බන්ධතාව මත දේව මඟ පෙන්වීම හරහා සමාජ මෙහෙවරෙහි යෙදෙමින් දේව රාජ්‍යයේ අගයන් කරා සමාජය පරිවර්තනය කිරීම ද සෑම කිතුනුවකුගෙන් ද, කිතුනු පවුල්වලින් හා කිතුනු සභාව නැමැති විසල් පවුලෙන් ද දෙවිඳුන් අපේක්ෂා කරන සේක.

**"ක්‍රිස්තුස් ජේසුස් වහන්සේ තුළ පැවති ජීවිත ආකල්ප ඔබ තුළත් පවතීවා"**

**(පිලිප්පි 2 : 5 )**

❖ ඇගැයීම :-

1. යුක්ති ගරුක ලෙස ජීවත් වීමටත් දේව රාජ්‍යයේ අගයන් තුළ සමාජ පරිවර්තනයක් ඇති කිරීමත් අවශ්‍ය යැයි ඔබ සිතන ඔබ පරිසරයේ ඇති තත්ත්ව මොනවා ද?

   ඒ සඳහා පෞද්ගලිකව ද පවුලක් ලෙස ද කිතුනු සමාජයක් ලෙස ද ඔබ කෙසේ ක්‍රියා කළ යුතු ද?

2. අනාථ නිවාසයක්, සුනාමි කඳවුරක් තුළ තම ළමා සහෝදර සහෝදරියන් ප්‍රීතිමත් ව තබන්නට ඔවුන් ගොඩනංවන්නට ඔබට ඇති සැලසුම් මොනවා ද?